ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 149 — 1975 ජනවාරි 31 වැනි සිකුරාදා — 1975.01.31

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 79 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... ... | — | අය-වැය ලේඛන ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... | — | විවිධ දැන්වීම් ... ... ... | 80 |


## පළාත් පාලන නිවේදන

### කැකිරාව සුළු නගර සභාව

සුළු නගර සභා ආඥාපනත

1975 වර්ෂය සඳහා වූ විශේෂ ජල බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපණතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ කැකිරාව සුළු නගර සභාවේ පාලන නිලධාරි විසින්, අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව කැකිරාව නගරය තුළ පිහිටිටා ඇති සියළුම නිශ්චල දේපල වල (කුඹුරු මුඩු බිම් හැර) වාර්ෂික වටිනාකමින් සියයට පහ බැගින් වූ විශේෂ ජල බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන් හි දී සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන සේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන කොමසාරිස් විසින් දෙන ලද අනුමතිය ඇතිව, 1975 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. ජී. ඩී. එස්. ද. අල්විස්,
පළාත් පාලන කොමසාරිස්,

1974. 12. 27 වන දින,
කොළඹ දී ය.

1-652/1—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

---

### කැකිරාව සුළු නගර සභාව

සුළු නගර සභා ආඥාපනත

1975 වර්ෂය සඳහා වූ විශේෂ කසළ බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපණතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ කැකිරාව සුළු නගර සභාවේ පාලන නිලධාරි විසින්, අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්ව කැකිරාව නගරය තුළ පිහිටා ඇති සියලුම නිශ්චල දේපල වල (කුඹුරු මුඩු බිම් හැර) වාර්ෂික වටිනාකමින් සියයට පහ බැගින් වූ විශේෂ කසළ ශෝධන බද්දක් පිළිවෙලින් මාර්තු 31 ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි දී සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන සේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන කොමසාරිස් විසින් දෙන ලද අනුමතිය ඇතිව 1975 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. ජී. ඩී. එස්. ද අල්විස්,
පළාත් පාලන කොමසාරිස්,

1974. 12. 27 වන දින,
කොළඹ දී ය.

1-652/2—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**1972 දෙසැම්බර් මස 15 වැනි දින,**
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

# විවිධ දැන්වීම්

### පොල්ගහවෙල සුළු නගර සභාව

ගෝඝාතක ආඥාපනත

මෙහි පහත දැක්වෙනු උපලේඛනයෙහි සඳහන් අය විසින් ඒ අයගේ නම ඉදිරියෙන් සඳහන් ස්ථානයෙහි මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, එම බලපත්‍ර නිකුත් කිරීම ගැන පොල්ගහවෙල සුළු නගර සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු මතයයි දැක්වෙන පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින දාහතර (14) දවසක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් ගෝඝාතක ආඥාපනතේ (272 අධිකාරය) අංක 7 දරණ වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

| ස්ථානයේ නම | ඉල්ලුම්කරුගේ නම |
|---|---|
| (1) බත්දාව මස් කඩ කාමරය ... | ඇම්. පී. ඇම්. පයිසර් |
| (2) පොල්ගහවෙල පොදු වෙළඳ පොලේ අංක 28 දරණ හරක් මස් කඩ කාමරය ... | ඇම්. එච්. ඇම්. අම්සාර් |
| (3) පොල්ගහවෙල පොදු වෙළඳ පොලේ අංක 30 එළු මස් කඩ කාමරය... | ඇම්. එච්. ඇම්. තව්ෆික් |

ඩබ්ලිව්. ගාමිනී ද සිල්වා,
සභාපති.

1975 ජනවාරි 03 වැනි දින,
පොල්ගහවෙල සුළු නගර සභා කාර්යාලයේ දිය.

1-646/1—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

---

### පොල්ගහවෙල සුළු නගර සභාව

ගෝ ඝාතක ආඥාපනත (272 අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් (ගෝඝාතක) පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරියේ) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරී තැන් වූද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්ගහවෙල සුළු නගර සභාවේ සභාපති ඩබ්ලිව්. ගාමිණී ද සිල්වා වන මම, 1975 වර්ෂයේදී මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් වන දිනයන්හි දී පොල්ගහවෙල සුළු නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් විකිණීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

උපලේඛනය

ජනවාරි 27, පසලොස්වක පෝය දිනය
පෙබරවාරි 25, පසලොස්වක පෝය දිනය
මාර්තු 26, පසලොස්වක පෝය දිනය
අප්‍රේල් 25, පසලොස්වක පෝය දිනය
මැයි 24, පසලොස්වක පෝය දිනය
මැයි 25, පසලොස්වක පෝය දිනය (අතිරේක දිනය)
ජූනි 23, පසලොස්වක පෝය දිනය
ජූලි 22, පසලොස්වක පෝය දිනය
අගෝස්තු 21, පසලොස්වක පෝය දිනය
සැප්තැම්බර් 19, පසලොස්වක පෝය දිනය
සැප්තැම්බර් 26, බණ්ඩාරනායක ගුණානුස්මරණ දිනය
ඔක්තෝබර් 19, පසලොස්වක පෝය දිනය
නොවැම්බර් 18, පසලොස්වක පෝය දිනය
දෙසැම්බර් 18, පසලොස්වක පෝය දිනය

ඩබ්ලිව්. ගාමිනී ද සිල්වා,
සභාපති.

1975 ජනවාරි 03 වැනි දින,
පොල්ගහවෙල, සුළු නගර සභා කාර්යාලයේ දී ය.

1-646/2—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

---

### දෙහිගම්පල් කෝරලේ එගොඩපොත පත්තු ගම් සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 අධිකාරය)

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් 1975 වර්ෂය වෙනුවෙන් මස් ගෙනවිත් තබා වෙළඳාම පිණිස මස් කඩයක් පවත්වා ගෙන යාමට ඉල්ලුම් පත්‍රයක් ඉල්ලුම් කර සිටින බවත්, ඒ අනුව බලපත්‍රය නිකුත් කිරීම ගැන දෙහිගම්පල් කෝරලේ එගොඩපොත පත්තු ගම් සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නෙහි නම්, එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලකර දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 7 (2) (ආ) වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. එච්. ඇල්. ඇම්. සමීන් ... ... ... | ගෝනකැදෙනිය, ගෝනගල්දෙනිය, වහරක ... | හරක් මස් වෙළඳාම |

සී. ජේ. සමරනායක,
පරිපාලන නිලධාරි, දෙ. කෝ. එගොඩපොත
පත්තු ගම් සභාව.

1975 ජනවාරි මස 08 දින,
රුවන්වැල්ල,
ඉඹුලාන ගම් සභා කායර්ාලයේ දී ය.

1—671.—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය.

---

### හේවාවිස්ස ගම්සභාව—කුරුණෑගල දිස්ත්‍රික්කය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛණයෙහි සඳහන් අය විසින් 1975 අවුරුද්දේ එම ව්‍යාපාරය සඳහා බලපත්‍ර ඉල්ලා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර තිබෙන බවත්, එකී බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමට හේවාවිස්ස ගම් සභාව බල සීමාව ඇතුලත පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්ත කොට මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පල වූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 වන අධකාරය) 7 (2) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. යූ. ඒ. කරීම්, තල්ගස්පිටිය, අඹකොටේ ... ... | තල්ගස්පිටිය, ගම්සභාවට අයත් වාගහමුලවත්ත, මස්කඩය ... | එළුහරක් |

කේ. ඩී. ශාන්ත ජයවර්ධන,
පාලන නිලධාරි, හේවාවිස්ස ගම් සභාව

1975 ජනවාරි මස 06 වෙනි දින,
හේවාවිස්ස ගම්සභා කායර්ාලය.
අඹකොටේ.

1-687.—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය.

## කඩුගන්නාව නගර සභාව

### නගරසභා ආඥාපනත

255 වන අධිකාරය වන මහ නගරසභා ආඥාපනතේ 162-164 වගන්ති යටතේ කඩුගන්නාව නගරසභාව විසින් මේ නිවේදනය යාකොට ඇති උපලේඛනයේ විස්තරවන බලපත්‍ර සම්බන්ධයෙන්, මේ දක්වා අයකළ හැකිව තිබූ ගාස්තු වෙනුවට, මෙම නිවේදනය 1975 ජනවාරි මස 1 වැනි දින සිට වලංගුවන පරිදි එම උපලේඛනයේ නිශ්චිතව සඳහන් බලපත්‍ර ගාස්තු පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජෝර්ජ් ගුණසේකර,
කඩුගන්නාව නගරසභාවේ සභාපති.

1975 ජනවාරි මස 1 වැනි දින,
කඩුගන්නාව නගරසභා කායඹාලය.

### උපලේඛනය

පහත සඳහන් කාර්ය්‍යයන් සම්බන්ධයෙන් ගොඩනැගිල්ලක් හෝ භූමි භාගයක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීම සඳහා බලය පවරාදෙන බලපත්‍රය.

| බලපත්‍රයේ ස්වභාවය | බලපත්‍ර ගාස්තුව රු. ශ. |
|---|---|
| (1) භෝජන ශාලාවක් පවත්වාගෙන යාම ... | 50 0 |
| (2) බත් කඩයක් පවත්වාගෙන යාම ... | 20 0 |
| (3) බේකරියක් පවත්වාගෙන යාම ... | 40 0 |
| (4) තේ, කෝපි කඩයක් පවත්වාගෙන යාම ... | 15 0 |
| (5) තේ සහ බත් කඩයක් පවත්වාගෙන යාම ... | 30 0 |
| (6) භෝජනාගාරයක් පවත්වාගෙන යාම (රෙස්ටුරන්ට්) | 50 0 |
| (7) ලැගුම්හලක් පවත්වාගෙන යාම ... | 125 0 |
| (8) බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම ... | 20 0 |
| (9) මුද්‍රණාලයක් පවත්වාගෙන යාම ... | 75 0 |
| (10) මෝටර් රථ හා මෝටර් සයිකල් වැඩපලක් පවත් වාගෙන යාම ... ... ... | 100 0 |
| (11) ලී ගබඩා කිරීම පවත්වාගෙන යාම ... | 50 0 |
| (12) දර ගබඩා කිරීම ... | 20 0 |
| (13) ස්වර්ණාභරණ කර්මාන්තයක් පවත්වාගෙන යාම ... | 50 0 |
| (14) බයිසිකල් වැඩපලක් පවත්වාගෙන යාම ... | 25 0 |
| (15) පැට්‍රල් සේවා ස්ථානයක් පවත්වාගෙන යාම ... | 100 0 |
| (16) විදුලි කාර්මික වැඩපලක් පවත්වාගෙන යාම ... | 25 0 |
| (17) කබුක් ගල් බොරළු හෝ ගල් ලබා ගැනීම සඳහා වළවල් හෑරීම ... | 25 0 |
| (18) ලෝකුරු වැඩකරන පට්ටලයක් හෝ කම්හලක් පවත්වාගෙන යාම ... | 25 0 |
| (19) කරවල ගබඩා කිරීම ... | 20 0 |
| (20) බීඩි කර්මාන්තයක් පවත්වාගෙන යාම ... | 35 0 |
| (21) දුම්කොළ ගබඩා කිරීම (සිල්පන් 3 කට වැඩි) ... | 75 0 |
| (22) සුරුට්ටු සෑදීම පවත්වාගෙන යාම ... | 25 0 |
| (23) ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම ... | 60 0 |
| (24) උළු ගඩොල් ගබඩාකර තැබීම ... ... | 50 0 |
| (25) ලී හා දර ගබඩා කර තැබීම ... | 75 0 |
| (26) හුණු ගබඩා කිරීම ... | 30 0 |
| (27) යන්ත්‍රානුසාරයෙන් මිරිස් කුඩු ඇඹරීම ... | 75 0 |
| (28) ගෝනි ගබඩා කිරීම ... | 75 0 |
| (29) ගැලුම් 12 කට වැඩියෙන් ඇසිටික් ඇසිඩ් ගබඩා කර තැබීම ... ... ... | 25 0 |
| (30) යන්ත්‍රානුසාරයෙන් වී, තිරිඟු, කුරක්කන් හා වෙනත් ධාන්‍ය වර්ග ඇඹරීම ... | 50 0 |
| (31) වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම ... | 25 0 |
| (32) යන්ත්‍රානුසාරයෙන් රබර් සෑදීම ... | 150 0 |
| (33) සිල්ලර කඩයක් පවත්වාගෙන යාම ... | 25 0 |
| (34) තොග වශයෙන් විකිනීමේ කාර්යය සඳහා ආහාර සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තැබීම ... | 75 0 |
| (35) තෙල් වලින් හෝ ඉන්ධන වලින් වාෂ්ප බලයෙන් ක්‍රියා කරන හෝ විදුලිබලයෙන් ක්‍රියාකරන යන්ත්‍ර පාවිච්චි කිරීමේ ව්‍යාපාරයක් ... ... | 50 0 |
| (36) හිස් බෝතල ගබඩා කර තැබීම ... | 25 0 |
| (37) කෙඳි වගී සෑදීම හෝ ගබඩා කර තැබීම ... | 20 0 |
| (38) හුණුගල් පිච්චීම, සකස් කිරීම, කැබැලිවලට කැඩීම, හෝ ගබඩාකර තැබීම ... ... | 25 0 |
| (39) ලොන්ඩරියක් පවත්වාගෙන යාම ... | 20 0 |
| (40) තේ කුඩු ගබඩා කිරීම ... | 25 0 |
| (41) ගවමස් වෙළඳසැලක් පවත්වාගෙන යාම ... | 50 0 |
| (42) එළුමස් වෙළඳසැලක් පවත්වාගෙන යාම ... | 50 0 |
| (43) මාළු වෙළඳසැලක් පවත්වාගෙන යාම ... | 250 0 |

1-649—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

---

## ලුණුගල සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 පරිච්ඡේදය) 17 (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි, නිසි බලධරයා වූ ද, ලුණුගල සුළු නගර සභාවේ සභාපති වූ ද, ඩී. වී. ඩී. වීරසේකර වන මම 1975 වර්ෂය තුලදී මෙහි පහත සඳහන් උපලේඛණයේ දැක්වෙන දිනයන්හිදී, ලුණුගල සුළු නගර සභා සීමාව තුල මස් පිණිස සතුන් ගාල් කිරීම හෝ ඒ සඳහා සතුන් මැරීම හෝ මස් විකිණීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

1975 ජනවාරි මස 06 වැනි දින,
ලුණුගල,
සුළු නගර සභා කායඹාලයේ දී ය.

ඩී. වී. ඩී. වීරසේකර,
සභාපති,
සුළු නගර සභාව, ලුණුගල.

### උපලේඛණය

සියලුම පසලොස්වක පෝය දිනයන් හා ඊට අමතරව පහත සඳහන් දිනයන් --

1975 මැයි 22 (ජන රජ දිනය)

1975 මැයි 24 (වෙසක් පසලොස්වක දිනට පසු දින)

1975 සැප්තැම්බර් 17 (අනගාරික ධර්මපාල දිනය)

1975 සැප්තැම්බර් 26 (බණ්ඩාරනායක අනුස්මරන දිනය)

1975 ඔක්තෝබර් 04 (ලෝක සත්ව දිනය)

1-673—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

---

## වාද්දුව සුළු නගර සභාව

### 1975 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

**සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපණත (477 වැනි අධිකාරය)**

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපණතේ (477 වැනි අධිකාරය) 4 වැනි වගන්තිය ප්‍රකාර වාද්දුව සුළු නගර සභා සීමාව තුල තබා ගන්නා සෑම බල්ලෙකු වෙනුවෙන් රු. 1 ක් ද, බැල්ලියක වෙනුවෙන් රු. 1.50 ක් ද ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1975 වර්ෂයට පණවා ඇති බවද, එකී ගාස්තු 1975 වර්ෂයේ මාර්තු 31 දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇම්. ඩී. ඒ. ගුණතිලක,
සභාපති,
සුළු නගර සභාව, වාද්දුව.

1974 දෙසැම්බර් මස 04 දින,
වාද්දුව සුළු නගර සභා කාර්යාලයේ දීය.

1-695/1—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

## වැද්දුව සුළු නගර සභාව

### 1975 වර්ෂය සඳහා රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද

(256 වැනි අධිකාරය) වන සුළු නගර සභා ආඥාපණත, වැද්දුව සුළු නගර සභාව මගින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

1. 256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපණතේ අංක 161 (1) දරණ වගන්තිය යටතේ පහත උපලේඛණයේ විස්තර වන ගණන් අනුව 1975 අවුරුද්දට රථ වාහන හා සතුන් සඳහා බද්දක් පණවා අය කිරීමට ද,

2. එකී ආඥාපණතේ 162 (3) වගන්තිය යටතේ එකී බදු 1975 මාර්තු මස 31 වෙනිදාට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින් ද වේ.

### උපලේඛණය

රු. ශ.

මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි කරත්ත අත් කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අත් දම්මේ වාහනයකු සඳහා ... ... 5 00

සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්—

(අ) වෙළඳාම් පිණිස පාවිච්චි කරන්නේ නම් ... 5 0

(ආ) වෙළඳාමට හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් ... ... 1 0

ඕනෑම අත් දමට ගොන් දෙන්නා බැඳි සෑම බරකරත්තයක් සඳහා හෝ තිරික්කලයක් සඳහා ... 4 0

තනිගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... 2 0

තනි ගොනා බඳින සෑම බරබාගයක් හෝ තිරික්කලයක් වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... 3 0

සෑම අත් කරත්තයක් සඳහා ... ... 1 0

සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... 2 50

සෑම අශ්වයෙක් හෝ පෝනියෙක් හෝ අශ්වතරයෙක් සඳහා ... 5 0

සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... 1 0

ඇම්. ඩී. ඒ. ගුණතිලක,
සභාපති,
සුළු නගර සභාව, වැද්දුව.

1974 දෙසැම්බර් මස 04 වැනි දින,
වැද්දුව සුළු නගර සභා කාර්යාලයේදීය.

1–695/2—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

---

## කිරම ගම් සභාව

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ උතුරු ගිරුවා පත්තුවේ කිරම ගම් සභාව විසින් පහත සඳහන් බදු හා බලපත්‍ර ගාස්තු ආදිය කිරම ගම් සභා ප්‍රදේශය තුල 1975 වර්ෂය සඳහා පනවා අය කිරීමට 1974 ඔක්තෝබර් මස 31 වැනි දින පෙරවරු 9.30 ට කිරම පිහිටි ගම් සභා කාර්යාලයේදී පවත්වන ලද මාසික සභා රැස්වීමේදී සාකච්ඡා කොට සම්මත කරගත් බව 257 වැනි අධිකාරයේ වූ ගම් සභා ආඥාපණතේ 52 වැනි වගන්තිය යටතේ 1961 අංක 60 දරණ පණතින් සංශෝධිත සම්පාදිත නියෝග මාලාවේ IV වැනි කාණ්ඩයේ 8 (1) වැනි නියෝගය ප්‍රකාර ප්‍රදේශවාසීන් වෙත මෙසින් දැනුම් දෙනු ලැබේ. අක්කර බදු මුදල් ඒ ඒ කාර්තුව අගදී ගෙවිය හැකිය.

1. අක්කර බද්ද : රු.ශ.

අක්කර 5 සහ ඊට වැඩි ඉඩම් වලින් සෑම අක්කර කින් ම ... ... 2 0

2. රථවාහන හා සත්තු බද්ද :

සෑම බයිසිකලයකින් ම ... ... 1 0

අත් කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ කරත්තය හැර වෙන ඕනෑම අත් දමක වාහනය කින් ම ... ... 5 0

ගොන් දෙන්නා බඳින සෑම බරකරත්තයකින් ම හා තිරික්කලයකින් ම ... ... 5 0

තනි ගොනා බඳින සෑම බර කරත්තයකින් ම හා තිරික්කලයකින් ම ... ... 2 50

සෑම ජින් රික්ෂෝ කරත්තයකින් ම ... 2 50

සෑම ඇතෙකුටම හා අලියෙකුටම ... ... 10 0

සෑම අශ්වයෙකුටම ... ... 5 0

සෑම අශ්වතරයෙකුටම ... ... 2 50

සෑම බූරුවෙකුටම ... ... 2 50

3. බලපත්‍ර ගාස්තු :

තේ හෝ කෝපි කඩයකින් ... ... 15 0

බත් කඩයකින් ... ... 10 0

බේකරියකින් ... ... 30 0

පෞද්ගලික වෙළඳාම් පලකට ... ... 250 0

4. කිරි පට්ටි පැවැත්වීම :

1. දෙනුන් 1 සිට 5 දක්වා කිරි පට්ටියකට ... 10 0
2. දෙනුන් 5 සිට 10 දක්වා කිරි පට්ටියකට ... 15 0
3. දෙනුන් 10 සිට 25 දක්වා කිරි පට්ටියකට ... 25 0
4. දෙනුන් 25 වැඩි සෑම කිරි පට්ටියකින් ම ... 60 0

5. අප්‍රිය හා අන්තරාදායක කර්මාන්ත :

1. ආහාර ද්‍රව්‍ය සිල්ලර වෙළඳාම ... ... 25 0
2. ආහාර ද්‍රව්‍ය තොග වෙළඳාම ... ... 100 0
3. එළවලු හෝ පළතුරු වෙළඳාම ... ... 10 0
4. කරවල හෝ ජාඩි වෙළඳාම ... ... 15 0
5. අලුත් මාළු විකුණන ස්ථානයකින් ... 25 0
6. මස් පිණිස සතුන් විකුණන හෝ මරණ ස්ථානයකින් ... ... 50 0
7. තේ කර්මාන්ත ශාලාවකින් ... ... 200 0
8. වී හෝ හාල් මෝලකට අශ්ව බල 1 ට ... 5 0
9. රබර් දුම් ගෙයක් තබා ගැනීම ... ... 25 0
10. රබර් රෝලක් තබා ගැනීම ... ... 25 0
11. රබර් කර්මාන්ත ශාලාවකින් ... ... 150 0
12. බාබර් සාප්පුවකින් ... ... 15 0
13. ගෘහ භාණ්ඩ සෑදීම හා විකිණීමට ... 25 0
14. බීඩි සාදන ස්ථානයකින් ... ... 15 0
15. බීඩි ගබඩා කරන ස්ථානයකින් ... ... 30 0
16. කොප්පරා වේලන ස්ථානයකින් ... 20 0
17. පැණි නිපදවීම ... ... 10 0
18. හකුරු නිපදවීමට ... ... 10 0
19. සංචාරක වෙළඳ ස්ථානයකින් ... 10 0
20. කොප්පරා ගබඩා කරන ස්ථානයකින් ... 100 0
21. රට උළු කර්මාන්ත ශාලාවකින් ... 125 0
22. කෙඳි වර්ග තෙලීම හෝ ගබඩා කිරීම ... 15 0
23. තෙල් වර්ග හෝ වෙනත් පැට්‍රල් ආදී දැවෙන ද්‍රව්‍ය වලින් හෝ ඉලෙක්ට්‍රික් බලයෙන් ක්‍රියා කරවන යන්ත්‍ර පාවිච්චි කරන කර්මාන්ත ශාලාවකින් ... 100 0
24. ලී මඩුවක් තබා ගැනීම ... ... 30 0
25. පැඟිරි තෙල් තොග ගබඩාවකින් ... ... 25 0
26. පැඟිරි තෙල් සිල්ලර ගබඩාවකින් ... 25 0
27. භූමිතෙල් වෙළඳාම් පලකින් ... ... 50 0
28. ස්වර්ණාභරණ සෑදීම හෝ විකිණීම ... 20 0
29. කම්හලකින් ... ... 20 0
30. පැඟිරි තෙල් නිපදවන ස්ථානයකින් ... 50 0
31. කුරුඳු තෙල් ගබඩා කරන ස්ථානයකින් ... 35 0
32. දර ගබඩා කරන ස්ථානයකින් ... ... 15 0
33. ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කරන ස්ථානයකින් 15 0
34. බයිසිකල් අලුත්වැඩියා කරන ස්ථානයකින් ... 10 0
35. මෝටර් ගරාජයක් පැවැත්වීම ... ... 50 0
36. කොහු මෝලක් හෝ කොහු නිපදවන ස්ථානයකින් 25 0
37. මුද්‍රණාලයකින් ... ... 25 0
38. විදුලි බලයෙන් හෝ රේඩියෝ අලුත්වැඩියා කරන ස්ථානයකින් හෝ රේඩියෝ කර්මාන්ත ශාලාවකින් බිම් ප්‍රමාණය වර්ග අඩි 200 කට නොවැඩි 30 0
39. බිම් ප්‍රමාණය වර්ග අඩි 200 කට වැඩි වන විට ... 60 0
40. රස කැවිලි නිපදවන ... ... 15 0
41. රෙදි මෝස්තර ඇඹීම හෝ විසිතුරු කිරීම ... 15 0
42. සිමෙන්ති හො. 25 කට වැඩිය ගබඩා කිරීම ... 25 0
43. හුණුගල් පිළිස්සීම හා රැස් කිරීම කරන ස්ථානයකින් 50 0

6. විනෝද බද්ද :

1952 මාර්තු 2 දින අංක 10,317 දරණ ගැසට් පත්‍රයේ පල කළ නිවේදනය අනුවයි.

7. නාට්‍ය සංදර්ශන ආඥාපනත :

වර්ෂයකට ... ... 90 0

අඩ වසරකට ... ... 67 0

මාස තුනකට ... ... 45 0

එක් මසකට ... ... 22 50

එක් දිනකට ... ... 3 0

සී. ඩී. ඇස්. කරුණානායක,
කිරම ගම් සභාවේ සභාවේ සභාපති.

ගම්සභා කාර්යාලය,
කිරම,
1974.12.27.

1–663—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

## බණ්ඩාරවෙල විශේෂ කොමසාරිස් කාර්යාලය

### ගෝඝාතක ආඥා පනත

මෙහි පහත දක්වෙන උප ලේඛනයේ නම් සඳහන් අයවලුන් එහි සඳහන් ස්ථානවල 1975 වර්ෂයේ මස් වෙළඳාම කර ගෙන යාම සඳහා බලපත්‍රයන් ඉල්ලමින් අයදුම්පත් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව ගෝ ඝාතක ආඥා පනතේ (272 වන පරිච්ඡේදයේ) 7 (2) වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍රයන් නිකුත් කිරීම ගැන බණ්ඩාරවෙල නගර සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණු නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වමි.

### උප ලේඛනය

| | අයදුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1. | එස්. ඒ. මොහමඩ් නිෂාර් මහතා, අංක 17, ප්‍රසිද්ධ වෙළඳසැළ, බණ්ඩාරවෙල | ... ගව මස් | අංක 17, ප්‍රසිද්ධ වෙළඳ සැල, බණ්ඩාරවෙල |
| 2. | සී. එච්. අබ්දුල් ලතීෆ් මහතා, බුහාරි ආපන ශාලාව, බණ්ඩාරවෙල | ... ගව මස් | අංක 18, ප්‍රසිද්ධ වෙළඳ සැල, බණ්ඩාරවෙල |

ආර්. සැන්ට් එස්. පෙරේරා,
විශේෂ කොමසාරිස්,
බණ්ඩාරවෙල නගරය.

1975 ජනවාරි මස 06 දින,
බණ්ඩාරවෙල, විශේෂ කොමසාරිස් කාර්‍ය්‍යාලයේ දීය.

1–576—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය.

---

## විශේෂ කොමසාරිස් කාර්යාලය—කඳාන නගරය

### සුළු නගර සභා ආඥාපනත (256 වන අධිකාරය)

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 161 සහ 163 වන වගන්ති යටතේ කඳාන සුළු නගර සභාව මගින් මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කෙරෙන බලපත්‍ර සම්බන්ධයෙන් 1975 වර්ෂයේ සිට එම උපලේඛනයේ නිශ්චිතව සඳහන් බලපත්‍ර ගාස්තු පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

තවද, පහත සඳහන් උපලේඛනයේ විස්තර කෙරෙන කිසියම් බල පත්‍රයක් සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති ගැසට් නිවේදනය මෙයින් අවලංගු කර ඇති බවත් මෙයින් දන්වනු ලැබේ.

බී. ඇන්. එෆ්. මෙන්ඩිස්,
විශේෂ කොමසාරිස්,
කඳාන නගරය.

1974 දෙසැම්බර් මස 31 වන දින,
කඳාන නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

### උපලේඛනය

#### I වැනි කොටස

#### අන්තරාදායක ව්‍යාපාර

| | බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. | ශ. |
|---|---|---|---|
| (1) | කබුක්, බොරළු හෝ කළුගල් කැණීම ... | 20 | 0 |
| (2) | කබුක්, බොරළු හෝ කළුගල් ගබඩා කිරීම ... | 25 | 0 |
| (3) | සිසිල් බීම නිෂ්පාදනය ... ... | 100 | 0 |
| (4) | ග්‍රෝස් 1 ට වැඩි ප්‍රමාණයක සිසිල් බීම බෝතල් ගබඩාකර තබාගැනීම ... ... | 10 | 0 |
| (5) | අයිස් නිපදවීම ... ... | 25 | 0 |
| (6) | කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩා කර තබාගැනීම ... ... | 50 | 0 |
| (7) | යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිෂ්කර්ෂණය ... ... | 150 | 0 |
| (8) | ගැලුම් 50 ට වැඩි ප්‍රමාණයක පොල්තෙල් ගබඩා කර තබා ගැනීම ... ... | 25 | 0 |
| (9) | පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක් ගැලුම් 12 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම ... ... | 10 | 0 |
| (10) | ගිනිපෙට්ටි නිෂ්පාදනය ... ... | 150 | 0 |
| (11) | ග්‍රෝස් 10 ට වැඩි ප්‍රමාණයක ගිනි පෙට්ටි ගබඩා කර තබා ගැනීම ... ... | 50 | 0 |
| (12) | ඉඹුල් පුළුන් හෝ කපු පුළුන් ගබඩා කර තබා ගැනීම ... ... | 15 | 0 |
| (13) | මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම ... ... | 25 | 0 |
| (14) | ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම ... | 50 | 0 |
| (15) | තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම ... ... | 50 | 0 |
| (16) | කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම ... ... | 50 | 0 |
| (17) | කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම ... ... | 25 | 0 |
| (18) | පිදුරු ගබඩා කර තබා ගැනීම ... ... | 10 | 0 |
| (19) | පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම ... | 10 | 0 |
| (20) | කුලියට දීම සඳහා ලාම්පු ගබඩා කර තබා ගැනීම ... | 10 | 0 |
| (21) | ධාන්‍ය හෝ මාෂ බෝග හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම ... | 15 | 0 |
| (22) | ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම ... ... | 50 | 0 |
| (23) | යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම ... ... | 100 | 0 |
| (24) | අතින් ලී ඉරණ ඉරුම් වළක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම ... ... | 10 | 0 |
| (25) | දැව ගබඩාවක් පවත්වාගෙන යාම ... | 100 | 0 |
| (26) | දර ගබඩාවක් පවත්වාගෙන යාම ... | 20 | 0 |
| (27) | ගිරිගල් හෝ හුණුගල් සඳහා සෑදීම ... | 15 | 0 |
| (28) | යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන කම්හලක් පවත්වාගෙන යාම ... ... | 50 | 0 |
| (29) | යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන කම්හලක් පවත්වාගෙන යාම ... ... | 5 | 0 |
| (30) | භොග විශයෙන් විකිණීම සඳහා පිටි ලුණු හෝ සීනි හොණ්ඩර 15 කට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම ... ... | 200 | 0 |
| (31) | හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම ... ... | 50 | 0 |
| (32) | බයිසිකල් හෝ මෝටර් සයිකල් අලුත්වැඩියා කිරීම සඳහා වැඩපොළක් පවත්වාගෙන යාම ... | 10 | 0 |
| (33) | අලුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම ... ... | 15 | 0 |
| (34) | පොල් කටු ගබඩා කර තබා ගැනීම ... | 15 | 0 |
| (35) | ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම ... | 15 | 0 |
| (36) | පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩා කර තබා ගැනීම ... ... | 15 | 0 |
| (37) | විසිතුරු පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටින්) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම ... | 25 | 0 |
| (38) | අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ වියීම ... ... | 250 | 0 |
| (39) | අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම ... ... | 100 | 0 |
| (40) | සිල්ක් සහ කෘත්‍රිම රෙදි විවීම හා විසිතුරු කිරීම ... | 100 | 0 |
| (41) | මැසූ ඇඳුම් නිෂ්පාදනය ... ... | 25 | 0 |
| (42) | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම ... ... | 50 | 0 |

| බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. | ශ. |
|---|---|---|
| (95) යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම ... | 50 | 0 |
| (96) වාත්තු මඩුවක් පවත්වාගෙන යෑම ... | 100 | 0 |
| (97) බෙලෙක් වැඩපොලක් පවත්වාගෙන යෑම ... | 25 | 0 |
| (98) ගල් ස්මාරක නිපදවීම ... ... | 30 | 0 |
| (99) පැට්‍රල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යෑම ... ... | 250 | 0 |
| (100) මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යෑම ... ... | 50 | 0 |
| (101) පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම ... | 25 | 0 |
| (102) කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම ... ... | 25 | 0 |
| (103) විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීම ... ... | 25 | 0 |
| (104) මදුරු කව (කොයිල්ස්) නිපදවීම ... | 25 | 0 |
| (105) ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම ... | 50 | 0 |
| (106) රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම ... | 100 | 0 |
| (107 ගල් තාර හෝ වෙනත් බිටුමන් මය නිෂ්පාදන නිපදවීම ... ... | 250 | 0 |
| (108 වීදුරු භාණ්ඩ නිපදවීම ... ... | 100 | 0 |
| (109) වීදුරු කැඩපත් නිපදවීම ... ... | 25 | 0 |
| (110) යකඩ තහඩු ගැල්වනයිස් කිරීම ... | 50 | 0 |
| (111) පාස්සන ඊයම් නිපදවීම ... ... | 50 | 0 |
| (112) ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම ... ... | 100 | 0 |
| (113) කටු කම්බි නිපදවීම ... ... | 50 | 0 |
| (114) කම්බි ඇණ නිපදවීම ... ... | 50 | 0 |
| (115) කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම ... ... | 25 | 0 |
| (116) බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම ... ... | 100 | 0 |
| (117) ජී. අයි. බාල්දි නිපදවීම ... ... | 50 | 0 |
| (118) වායු සමන යන්ත්‍ර ශීතකරණ හෝ අධි ශීතකරණ (ඩීප් ප්‍රීෂර්) නිපදවීම ... ... | 250 | 0 |
| (119) වායු සමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ (ඩීප් ප්‍රීෂර්) සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම ... ... | 50 | 0 |
| (120) බ්‍රේක් ලයිනිං හෝ ක්ලච් ලයිනිං නිපදවීම ... | 100 | 0 |
| (121) යන්ත්‍රෝපකරණ නිපදවීම ... ... | 200 | 0 |
| (122) විදුලි භාණ්ඩ නිපදවීම ... ... | 100 | 0 |
| (123) රබර් කැවුණු කෙඳි වර්ග නිපදවීම ... | 50 | 0 |
| (124) සංචායක බැටරි නිපදවීම ... ... | 75 | 0 |
| (125) වියළි කෝෂ බැටරි නිපදවීම ... ... | 50 | 0 |
| (126) ඊයම් බැටරි නැවත චාර්ජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම ... ... | 50 | 0 |
| (127) රන් කම් සුන් බුන් වලින් වටිනා ලෝහ නිෂ්කර්ශනය සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම ... | 50 | 0 |
| (128) ට්‍රැක්ටර් රථ එකලස් කිරීම ... ... | 100 | 0 |
| (129) රේඩියේටර් නිපදවීම ... ... | 100 | 0 |
| (130) විදුලි කර්මාන්ත වැඩපොලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන වැඩපලක් හෝ ගුවන් යන්ත්‍ර වැඩපලක් පවත්වාගෙන යෑම... | 50 | 0 |

1–824—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

---

## සීක්කඩුව සුළු නගර සභාව

1975 වර්ෂයේ වරිපනම් ලේඛනය

1975 වර්ෂය සඳහා මෙම සුළු නගර සභාවේ වරිපනම් ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන කාර්යාල වේලාවන් හිදී මෙම කාර්යාලයේදී පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත්, 256 වැනි අධිකාරයවූ සුළු නගර සභා ආඥපනතේ 165 වැනි වගන්තියේ කියැවෙන පරිදි 252 වැනි අධිකාරයවූ මහ නගරසභා ආඥපනතේ 235 (1) දරණ වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

බී. ජේ. වීරසේකර,
සභාපති,
සීක්කඩුව සුළු නගර සභාව.

1975 ජනවාරි මස 8 වැනි දින,
සුළු නගර සභා කායර්‍යාලය,
සීක්කඩුව.

1–714—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

---

## යටිනුවර ගඟපළාත ගම් සභාව—මහනුවර දිස්ත්‍රික්කය

ගෝඝාතන ආඥපනත

මෙහි පහත උපලේඛනයේ දක්වෙන අය විසින් 1975 වර්ෂයට මස් කඩයක් පවත්වා ගෙන යාම සඳහා බල පත්‍ර අල්ලුම් පත්‍ර ඉදිරිපත් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන යටිනුවර ගඟ පළාත ගම් සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත්, ලියවිල්ලක්, මෙම දන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවිය යුතු බව ගෝඝාතන ආඥපනතේ (272 අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම කරන ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. අයි. ඇල්. ඇම්. ඇස්. ඩීන්, ... ... | අංක 68, පහළ ඊරියගම, පේරාදෙනිය ... ... | හරක් මස් |
| 2. අයි. ඇල්. ඇම්. ඇස්. ඩීන් ... ... | අංක 69/3, පහළ ඊරියගම, පේරාදෙනිය ... ... | හරක් මස් |
| 3. ඒ. බදුර්දීන් ... ... ... | අංක 38, මුරුතලාවවත්ත, මුරුතලාව ... ... | හරක් මස් |

ගුණරත්න මානෙල්ලංග,
සභාපති, යටිනුවර ගඟ පළාත ගම් සභාව.

මුරුතලාව, 74.10.22.

1–936/1.—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය.

---

## යටිනුවර ගඟ පළාත ගම් සභාව—මහනුවර දිස්ත්‍රික්කය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වෙන අය විසින් මස් පිණිස සතුන් මරා මස් පිණිස විකිණීම පිණිස 1975 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර ඇති බවත්, මෙම බල පත්‍රය නිකුත් කිරීමට විරුද්ධව යටිනුවර ගඟ පලාත ගම් සභා සීමාවේ පදිංචි ඕනෑම කෙනෙකුට, ඒ සඳහා තමා විරුද්ධ වන්නේ අසවල් කාරණය නිසායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 272 අධිකාරයේ අංක 7 වගන්තියේ 2 (ඒ) සහ (බී) උප වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

උපලේඛනය

| අයදුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| තම්බිලෙබ්බෙ මහරුප් ... ... | ... අටුවගාවත්ත, යහලතැන්න ... ... | හරක් මස් |

1–936/2.—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය.

## කොළඹ දිස්ත්‍රික්කයේ ඔයබොඩ පේරුව ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත විස්තර දැක්වෙන මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වැනි අධිකාරය) 7(2) වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අයවලුන් විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලා මා වෙත ඇයදුම්පත් ඉදිරිපත් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන ඔයබොඩ පේරුව ගම්සභා ප්‍රදේශ සීමාව තුල පදිංචි යම් කෙනෙකු වේ නම් තමා එසේ විරුද්ධවන්නේ කුමන හේතුවක් නිසාද යනවග පිටපත් දෙකකින් යුත් ලියවිල් ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවී දින 14 ක් ඇතුලත මා වෙත ඉදිරිපත් කළ යුතු බවත් මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥපනතේ (272 වන අධිකාරයේ) 7 (2) බී වන වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|
| 1. කේ. ඇම්. හනීපා, තිහාරිය, කළුගෙඩිහේන. | තිහාරිය නුවර පාරේ වෙළඳාම් පොලේ එළහරක් මස් හා එළුමස් වෙළඳාම. |

ඩී. ජී. විජයසුන්දර,
ඔයබොඩ පේරුව ගම්සභාවේ සභාපති.

ඔයබොඩ පේරුව ගම්සභාව,
කලොටුවාව—කළුගෙඩිහේන,
1975 ජනවාරි 8 වෙනි දින දීය.

1-670—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

---

## තොටගමුව තිරාණගම ගම්සභාව

### ගම්සභා ආඥපණත (257 වැනි පරිච්ඡෙදය)

ගාලු දිස්ත්‍රික්කයේ තොටගමුව තිරාණගම ගම්සභාව විසින් 1974 නොවැම්බර් මස 28 වැනි දින පැවැත්වූ මාසික සභා රැස්වීමේදී පහත සඳහන් අංක 7 (7) දරණ යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව, මහජනයාගේ දැනගැනීම පිණිස ප්‍රසිද්ධ කරනු ලැබේ. යෝජිත කරුණු සම්බන්ධයෙන් ඉඩම් හිමියන් හෝ ප්‍රදේශවාසී මහජනතාව විරුද්ධවන්නේ නම් එසේ විරුද්ධවීමට හේතු දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම් ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, මෙකී කාලය තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් ඉන් පසු එම පාරවල් ගම්සභාව සතු දේපළක් හැටියට සළකා පාලනය කරනු ලබන බවත් මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ඩබ්ලිව්. ඇම්. සැම්සන් ද සිල්වා,
තොටගමුව තිරාණගම ගම්සභාවේ සභාපති.

1974.12.31 දින,
තොටගමුව තිරාණගම ගම්සභා කාර්යාලය,
නාරිගම, හික්කඩුව.

#### යෝජනාව

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු අතුරු ව්‍යවස්ථා) ආඥපනතේ 3 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ තොටගමුව තිරාණගම ගම්සභාව විසින් 1974.1.11 දින අංක 94 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද යෝජනාවෙන් සම්මතකරගත් පොදු අතුරු ව්‍යවස්ථාවල IV වැනි කාණ්ඩයේ 1 වැනි අතුරු ව්‍යවස්ථාව අනුව, මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් එකිනෙක ඉදිරියේ සඳහන් කර ඇති දිග, පළල අනුව සාද හෝ නැවත සාද ගැනීම් හෝ ප්‍රති සංස්කරණය කර ගැනීම හෝ පවත්වාගෙන යාම කළ යුතු යයි පටුවත නියෝජිත විනී කාරියවසම් මහතා කළ යෝජනාව නලාගස්දෙනියේ නියෝජිත කේ. පී. ගුණදාස මහතා ස්ථිර කර ඒකමතිකව සභා සම්මත විය.

#### උපලේඛනය

| | පාරේ නම | දිග සැ. | දිග දු. | දිග අ. | පළල අඩි |
|---|---|---|---|---|---|
| | **කොට්ඨාශ අංක 1 පටුවත :** | | | | |
| 1. | පටුවත කටුකොළිහ පාර | 0 | 77 | 8 | 16 |
| 2. | පටුවත හෙන්නාතොට පාර | 0 | 13 | 21 | 16 |
| 3. | පටුවත තොටුපල පාර | 0 | 2 | 29 | 16 |
| 4. | පටුවත ගොරකගස්බොක්ක පාර | 0 | 15 | 20 | 16 |
| 5. | පටුවත කොහු අඹේ පාර | 0 | 27 | 15 | 16 |
| 6. | ගොරකගස්බොක්ක පාරේ ඉතිරි කොටස | 0 | 8 | 43 | 10 |
| 7. | පටුවත ගම්මඩුවත්ත පාර | 0 | 17 | 28 | 12 |
| 8. | හෙන්නාතොට කටුකොළිහ පාර | 0 | 26 | 14 | 12 |
| | **කොට්ඨාශ අංක 2 තිරාණගම :** | | | | |
| 1. | තිරාණගම විද්‍යාතිලක පාර | 0 | 28 | 6 | 16 |
| 2. | තිරාණගම අක්කරහේන පාර | 0 | 42 | 47 | 16 |
| 3. | තිරාණගම පන්විල පාර | 0 | 56 | 24 | 20 |
| 4. | දෙල්ගහදූව පාර | 0 | 28 | 52 | 16 |
| 5. | තිරාණගම මුහන්දිරම්ගොඩ පාර | 0 | 27 | 38 | 12 |
| | **කොට්ඨාශ අංක 3 කටුකොළිහ :** | | | | |
| 1. | සිරිකඳුර පරගහඅම්බලම පාර | 0 | 66 | 10 | 24 |
| 2. | දෙල්ගහකොට පාර | 0 | 30 | 20 | 16 |
| 3. | වැල්ලතොට වෙල්ල පාර | 0 | 23 | 40 | 16 |
| 4. | සුදුවැටිය බැරුකුඩුව පාර | 0 | 40 | 41 | 16 |
| 5. | කහටගහගෙඩැල්ල පාර | 0 | 15 | 25 | 8 |
| 6. | සුදු වැටිය මකවෙල්ල පාර | 0 | 20 | 15 | 16 |
| | **කොට්ඨාශ අංක 4 නාරිගම :** | | | | |
| 1. | නාරිගම පුංචි පතන් පාර | 1 | 0 | 52 | 20 |
| 2. | නාරිගම පුංචි පතන පාරේ සිට වැවල කෝවිල අද්දර ගොඩැල්ල ගම්සභා පාරට සම්බන්ධවන පාර | 0 | 11 | 0 | 12 |
| 3. | නාරිගම ඉහළ උඩුමුල්ල පාර | 0 | 15 | 28 | 10 |
| | **කොට්ඨාශ අංක 5 වැවල :** | | | | |
| 1. | වැවල නලාගස්දෙනිය පාර | 1 | 0 | 34 | 24 |
| 2. | වැවල නාරිගම පාර | 0 | 41 | 57 | 12 |
| 3. | නලාගස්දෙනිය වැවල කනත්ත පාර | 0 | 44 | 46 | 12 |
| | **කොට්ඨාශ අංක 6 වවුලාගොඩ :** | | | | |
| 1. | වවුලාගොඩ පාර | 0 | 10 | 17 | 18 |
| 2. | වවුලාගොඩ මහගෙදරවත්ත පාර | 0 | 10 | 29 | 12 |
| 3. | වෙරළුගහවත්ත කන්දඋඩ පාර | 0 | 25 | 50 | 12 |
| | **කොට්ඨාශ අංක 7 නලාගස්දෙනිය :** | | | | |
| 1. | නලාගස්දෙනිය නාකන්ද පාර | 0 | 49 | 57 | 16 |
| 2. | එගොඩගොඩ නාකන්ද පාර | 0 | 19 | 8 | 16 |
| 3. | නලාගස්දෙනිය මැද මාවත | 0 | 8 | 2 | 12 |
| 4. | නලාගස්දෙනිය වෙරළුගහවත්ත පාර | 0 | 9 | 16 | 12 |
| 5. | නලාගස්දෙනිය සුදුවැල්ල එගොඩගොඩ පාර | 0 | 24 | 16 | 12 |
| 6. | නලාගස්දෙනිය ලීනාවත්ත හරහා නාරිගම පාර | 0 | 46 | 34 | 12 |
| 7. | නලාගස්දෙනිය ඉදිගහඇලබඩවත්ත පාර | 0 | 1 | 54 | 12 |
| | **කොට්ඨාශ අංක 8 ජොමහන්දිගොඩ :** | | | | |
| 1. | ජොමුහන්දිගොඩ මහවත්ත පාර | 0 | 8 | 23 | 12 |
| 2. | ජොමුහන්දිගොඩ පාර | 0 | 22 | 32 | 16 |
| 3. | දහනායකගොඩ මඩබොක්ක පාර | 0 | 43 | 58 | 16 |
| 4. | ජොමහන්දිගොඩ වඩුගොඩ පාර | 0 | 12 | 58 | 12 |
| 5. | වඩුගොඩ ළිඳ පාර | 0 | 4 | 1 | 8 |
| 6. | ජොමහන්දිගොඩ අද්දරවත්ත පාර | 0 | 14 | 2 | 12 |
| | **කොට්ඨාශ අංක 9 තොටගමුව :** | | | | |
| 1. | තොටගමුව හඳඋඩුමුල්ල පාර | 0 | 7 | 50 | 16 |
| | **කොට්ඨාශ අංක 10 කලුපෙ :** | | | | |
| 1. | කලුපේ පඹකොස්ස පාර | 0 | 44 | 61 | 18 |
| 2. | කලුපේ මැදගොඩ පාර | 0 | 18 | 22 | 16 |
| 3. | කලුපේ මන්මාවිගොඩ පාර | 0 | 11 | 44 | 16 |
| 4. | කලුපේ උඩුමුල්ල පාර | 0 | 39 | 6 | 16 |
| 5. | කලුපේ කොරට්ටගොඩ පාර | 0 | 22 | 2 | 16 |
| | **කොට්ඨාශ අංක 11 වැරැල්ලාන :** | | | | |
| 1. | වැරැල්ලාන කලුපේ පාර | 0 | 74 | 16 | 20 |
| | **කොට්ඨාශ අංක 12 සීනිගම :** | | | | |
| 1. | සීනිගම කලුපේ පාර | 0 | 70 | 0 | 20 |
| | **කොට්ඨාශ අංක 13 මලවැන්න :** | | | | |
| 1. | මලවැන්න මුණුගොඩ පාර | 0 | 36 | 48 | 20 |
| 2. | මලවැන්න මැටිවල පාර | 0 | 44 | 11 | 16 |
| 3. | මලවැන්න කෝරළේගොඩ පාර | 0 | 25 | 46 | 12 |
| 4. | මලවැන්න මකලන්දූව පාර | 0 | 23 | 40 | 10 |

1-812—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

### විශේෂ කොමසාරිස් කාර්යාලය—රඹුක්කන නගරය

1975 වර්ෂයේ වරිපනම් ලේඛන

1975 වර්ෂය සඳහා වූ රඹුක්කන විශේෂ කොමසාරිස් කාර්යාලයේ වරිපනම් ලේඛණ දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛණ කාර්යාල වේලාවන්හිදී මහජනයාට පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත්, (256 වැනි අධිකාරය) වන සුළු නගර සභා ආඥාපනතේ 165 වැනි වගන්තිය සහ (252 වැනි අධිකාරය) වන මහ නගර සභා ආඥාපනතේ 235(1) දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. ඩී. සෝමතුංග
විශේෂ කොමසාරිස්—රඹුක්කන නගරය.

විශේෂ කොමසාරිස් කාර්යාලය,
රඹුක්කන.
1975.01.08

1–807—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

---

### හැටන්-දික්ඔය නගර සභාව

1975 වර්ෂයට දේපල බදු

නගර සභා ආඥාපනතේ (255 අධිකාරිය) 160 වගන්තිය යටතේ මෙම ගතවී යන 1974 වර්ෂයට බලපැවැත්වෙමින් තිබෙන පහත සඳහන් දේපල බද්ද 1975 වර්ෂයට ද එලෙසම පැනවීමට හැටන්-දික්ඔය නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

160 (2) වගන්තිය ප්‍රකාර මෙම නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන නගර සභා ජල සේවය ලබා දී ඇති ප්‍රදේශවල සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට විස්සක් (20%) හා ජල සේවය ලබාදී නොමැති ප්‍රදේශවල දේපල වාර්ෂික වටිනාකමින් සියයට දාහතක් (17%) බැගින් වන වරිපනම් බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්ගෙන් අවසන් වන අයුරු කාර්තු වශයෙන් ගෙවිය යුතු වේ.

පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන සීමාව තුල පිහිටි දේපල නගර සභා ජල සේවාව ලබාදී නොමැති දේපල ලෙස සලකනු ලැබේ.

උපලේඛනය

අංක 1 කොට්ඨාශයේ දිඹුලි පාරේ අංක 313 සිට 377 දක්වා ද, අංක 300 සිට 370/13 දක්වා ද, ගිනිගත්හේන පාරේ අංක 3 සිට 211 දක්වා ද, අංක 70 සිට 200 දක්වා ද දේපල.

අංක 6 කොට්ඨාශයේ දික්ඔය පාරේ අංක 371 සිට 425 දක්වා ද, අංක 500 සිට 600 දක්වා ද දේපල.

ඕ. දොන් විල්ප්‍රඩ්,
හැටන්-දික්ඔය නගර සභාවේ සභාපති.

1975. 01. 03 වැනි දින,
හැටන්-දික්ඔය
නගර සභා කාර්යාලයේ දීය.

1–804/1—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

---

### හැටන්-දික්ඔය නගර සභාව

1975 වර්ෂයේ වරිපනම් ලේඛණ

1975 වර්ෂය සඳහා මෙම පළාත් ආණ්ඩු සභාවේ වරිපනම් ලේඛන දැන් සූදානම්ව ඇති බවත්, එම ලේඛන කාර්යාල වේලාවන්හි දී බදු ගෙවන්නන් විසින් පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත්, 255 අධිකාරය වන පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 166 වගන්තියෙන් කියවෙන පරිදි හා 252 අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ 235 (1) වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඕ. දොන් විල්ප්‍රඩ්,
සභාපති,
හැටන් දික්ඔය නගර සභාව.

1975. 01. 08 දින,
හැටන්-දික්ඔය නගර සභා කාර්යාලයේ දීය.

1–804/2—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

---

### මාවත පත්තු ගම්සභාවේ විදුලි බලය සැපයීමේ බලයලත් ප්‍රදේශ දීර්ඝ කිරීම

වර්ෂ 1950 අංක 19 දරන විදුලිබල පනතේ 9 වැනි ඡේදය හා ඒ යටතේ වර්ෂ 1956 මාර්තු මස 2 වැනි දින අංක 10,899 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නියෝගයක් ප්‍රකාර මා වෙත පැවරී ඇති බලතල අනුව මාවත පත්තු ගම් සභාවට නිකුත්කුර ඇති වර්ෂ 1970 අප්‍රේල් මස 26 වැනි දින දරන විදුලිබල පත්‍රයේ 'ඒ' උපලේඛණයෙහි සඳහන් විදුලි බලය සැපයීමේ බලයලත් ප්‍රදේශ පහත දැක්වෙන පරිදි දීර්ඝ කිරීම පිළිබදව මවිසින් බලය පවරනු ලබන නිලධාරියකු වර්ෂ 1975 පෙබරවාරි මස 13 වැනි දින පෙරවරු 11.00ට එම ගම් සභා කාර්යාලයේදී විභාගයක් පවත්වනු ලබන බව සියළු දෙනාටම මෙයින් දැනුම් දෙනු ලැබේ.

**දීර්ඝ කරනු ලබන ප්‍රදේශය.**—කෑගල්ල නගර සභා සීමාවේ සිට බූලත් කොහුපිටිය මාර්ගයේ හෙට්ටිමුල්ල කඩ වීදිය දක්වා සහ එම මාර්ගයේ මැද සිට සැතපුම් බාගය (½) බැගින් දෙපසටද වේ.

මේ විභාගය සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීමට කැමති සියලුම පුද්ගලයින් පිටපත් තුන (3) කින් සමන්විත එම කරුණු කවරයක බහා මුද්‍රා තබා ප්‍රධාන විදුලිය පරීක්ෂක, වාරිමාර්ග, විදුලි බලය හා මහාමාර්ග අමාත්‍යාංශය, මහලේකම් කාර්යාලය, කොළඹ 1, යන ලිපිනයට වර්ෂ 1975 පෙබරවාරි මස 10 වැනි දින පෙරවරු 10ට මත්තෙන් ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් පැමිණ භාරදිය යුතුය.

ඉහත සඳහන් කරුණු සම්බන්ධව වැඩිමනත් විස්තර සඳහා මේ දැන්වීමේ පළමුවැනි කොටසේ සඳහන් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නියෝගයන් බලනු මැනවි.

එස්. තයානන්ද රාජා,
ප්‍රධාන විදුලිය පරීක්ෂක.

1–793—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

---

### හේවාවිස්ස කෝරළේ ගම් සභාව

මස්පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වෙනි අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කුරුණෑගල දිස්ත්‍රික්කයේ හේවාවිස්ස ගම්සභාවේ පාලන නිලධාරි වන මම, 1975 වර්ෂයේ දී පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන දිනයන්හි දී හේවාවිස්ස ගම්සභා සීමාව තුල මස් පිණිස සතුන් මැරීම හා මස් වෙළෙඳාම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

උපලේඛනය

1975 ජනවාරි 27
1975 පෙබරවාරි 25
1975 මාර්තු 26
1975 අප්‍රේල් 25
1975 මැයි 24, 25
1975 ජූනි 23
1975 ජූලි 22
1975 අගෝස්තු 21
1975 සැප්තැම්බර් 19
1975 ඔක්තෝබර් 04,19
1975 නොවැම්බර් 18
1975 දෙසැම්බර් 18

කේ. ඩී. ශාන්ත ජයවර්ධන,
පාලන නිලධාරි,
හේවාවිස්ස ගම්සභාව.

1975 ජනවාරි මස 08 වෙනි දින,
හේවාවිස්ස ගම්සභා කාර්යාලය,
අඹකොටේ.

1–785—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

## කින්යා නගරය

සුලු නගර සභා ආඥාපනත (256 වෙනි අධිකාරය)

සුළු නගර සභා ආඥාපනතේ (256 වෙනි අධිකාරයේ) 161 සහ 163 යන ඡේදයන් අනුව, 1975 වර්ෂය වෙනුවෙන් උපලේඛන ගත බලපත්‍ර ගාස්තු ප්‍රමාණයන් මෙයින් ප්‍රකාශනයට පත් කරමි.

1974 දෙසැම්බර් මස 12 වෙනි දින,
කින්යා නගරයේ විශේෂ කොමසාරිස් කාර්‍යාලයේ දීය.

බී. ඒ. ජේ. කාසිනාදර්,
විශේෂ කොමසාරිස්.

### උපලේඛනය

| | බලපත්‍ර ස්වභාවය | වාර්ෂික ගාස්තුව රු. | ශ |
|---|---|---|---|
| 1. | ගැලුම් 50 කට වැඩි පොල් තෙල් ගබඩාවක් සඳහා | 20 | 0 |
| 2. | ගඩොල් සහ උලු ගබඩා කිරීම සඳහා | 10 | 0 |
| 3. | පිදුරු හෝ ගොයම් ගබඩා කිරීම සඳහා | 10 | 0 |
| 4. | (අ) බුසල් 400ක් හෝ ගෝනි 100 කට නොවැඩි වී ගබඩා කිරීම සඳහා | 200 | 0 |
| | (ආ) බුසල් 100ක් හෝ ගෝනි 25 කට නොව ඩි වී ගබඩා කිරීම සඳහා | 50 | 0 |
| 5. | ස්වර්ණාභාරන සාදන හෝ අලුත් වැඩියා කරන ස්ථානයක් සඳහා— | | |
| | (අ) අයිතිකරු පමණක් සිටින ස්ථාන සඳහා | 40 | 0 |
| | (ආ) අයිතිකරු සහ සහායකයින් එක් අයෙක් හෝ ඊට වැඩිගණනක් සිටින ස්ථාන සඳහා | 125 | 0 |
| 6. | ඉරුම් වලක් හෝ ලී ඉරන මෝලක් සඳහා (සාමාන්‍ය) | 15 | 0 |
| 7. | ලී ගබඩාවක් සඳහා | 75 | 0 |
| 8. | දර මඩුවක් සඳහා | 15 | 0 |
| 9. | යන්ත්‍ර නොමැති කම්මලක් සඳහා | 20 | 0 |
| 10. | හොන්ඩර 15කට වැඩි ප්‍රමාණයකින් තොග වශයෙන් පිටි, ලුනු, සීනි විකිණීමට තැන්පත් කර ඇති ගබඩාවක් සඳහා | 50 | 0 |
| 11. | හිස් ගෝනි සහ බෝතල් ගබඩාවක් සඳහා | 10 | 0 |
| 12. | මෝටර් සයිකල් සහ පාපැදි අලුත් වැඩියා කරන කර්මාන්ත ශාලාවක් සඳහා | 20 | 0 |
| 13. | මහන ලද ඇඳුම් නිෂ්පාදනාගාරයක් සඳහා | 15 | 0 |
| 14. | පොහොර සහ කෘෂිකාර්මික රසායන ද්‍රව්‍ය නිෂ්පාදනාගාරයක් සඳහා | 30 | 0 |
| 15. | හන් ගබඩාවක් සඳහා | 60 | 0 |
| 16. | කුකුලන් 100කට වැඩි කුකුල් කොටුවක් සඳහා | 25 | 0 |
| 17. | තොග වශයෙන් විකිණීම පිණිස ගබඩාකර ඇති නරක්වන සුලු කෑම ද්‍රව්‍යයන් සහ පාරිභෝගික ද්‍රව්‍ය ගබඩාවක් සඳහා | 30 | 0 |
| 18. | හොන්ඩර 3කට වැඩි ප්‍රමාණයකින් කරවල සහ ජාඩි ගබඩාකර ඇති ස්ථානයක් සඳහා | 30 | 0 |
| 19. | මාලු වේලන හෝ අයිස් දමන ස්ථානයක් සඳහා | 100 | 0 |
| 20. | හොන්ඩර 25 කට වැඩි සිමෙන්ති ගබඩාවක් සඳහා | 100 | 0 |
| 21. | කටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් සඳහා | 25 | 0 |
| 22. | ගෘහ භාණ්ඩ සාදන හා ගබඩා කරන ස්ථානයක් සඳහා | 30 | 0 |
| 23. | වේ වැල් භාණ්ඩ නිෂ්පාදනය සහ ගබඩා කරන ස්ථානයක් සඳහා | 15 | 0 |
| 24. | වඩු කර්මාන්ත ශාලාවක් සඳහා | 20 | 0 |
| 25. | පලතුරු යුෂ සහ පලතුරු බීම සෑදීම සඳහා | 10 | 0 |
| 26. | ධාන්‍ය, කෝපි, පිටි සහ කුළු බඩු ඇඹරුම්හලක් සඳහා | 50 | 0 |
| 27. | කොටස් ප්‍රමාණයන් ලැබෙන වී මෝල් සඳහා ; (1) ගැලුම් 1ක් සහිත | 175 | 0 |
| | (2) ගැලුම් 2ක් හෝ ඊට වැඩි | 250 | 0 |
| 28. | කොටස් ප්‍රමාණයන් නොලැබෙන වී මෝලක් සඳහා : (1) ගැලුම් 1ක් සහිත | 100 | 0 |
| | (2) ගැලුම් 2ක් හෝ ඊට වැඩි | 125 | 0 |
| 29. | ටයර් සහ ටියුබ් වෝල්කනයිසිං කරන ස්ථානයක් සඳහා | 15 | 0 |
| 30. | ඡායාරූප ශාලාවක් සඳහා | 50 | 0 |
| 31. | ඇඳුම් පිරිසිදු කරන සහ වර්ණ කිරීමේ ස්ථානයක් සඳහා | 10 | 0 |
| 32. | බැටරි චාජ් කිරීම සහ අලුත් වැඩියා කරන ස්ථානයක් සඳහා | 20 | 0 |
| 33. | මෝටර් රථ සර්විස් කිරීම සහ අලුත් වැඩියා කරන ස්ථානයක් සඳහා | 40 | 0 |
| 34. | බෙලෙක් කර්මාන්ත ශාලාවක් සඳහා | 10 | 0 |
| 35. | පැට්‍රල්, ඩීසල් සහ රසායනික තෙල් වර්ග ගබඩාවක් සඳහා | 120 | 0 |
| 36. | විදුලි භාණ්ඩ, ගුවන් විදුලි යන්ත්‍ර, විකිණීමට ඇති ස්ථානයක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර සාදන ස්ථානයක් සඳහා | 20 | 0 |
| 37. | බේකරියක් සඳහා | 30 | 0 |
| 38. | බොජුන් හලක් සඳහා | 25 | 0 |
| 39. | තේ හෝ කෝපි කඩයක් සඳහා | 20 | 0 |
| 40. | බාබර් සාප්පුවක් සඳහා | 25 | 0 |
| 41. | මස් වෙළඳ සලක් සඳහා | 10 | 0 |
| 42. | මස් මරන්නන්ගේ බලපත්‍රයක් සඳහා | 25 | 0 |
| 43. | බෙහෙත් ද්‍රව්‍ය වෙළඳ සැලක් සඳහා | 20 | 0 |

1–770—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

---

## මඩකලපුව නාගරිකය

වරිපනම් ලේඛනය පරීක්ෂා කිරීම

1975 වර්ෂයේ මෙම නාගරිකයේ වරිපනම් ලේඛන සූදානම් කර ඇති බවත්, නියමිත කාර්යාල වේලාවන් තුලදී මඩකලපුව නාගරික කාර්යාලයේ දී මහජනයාට පරීක්ෂා කර බැලීම සඳහා මෙම ලේඛන තබන බවත්, මහ නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරය) 235(1) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

කේ. පී. ගුණරත්න,
නාගරික කොමසාරිස්, මඩකලපුව.

1975. 01. 03 වැනි දින,
මඩකලපුව නාගරික කාර්යාලයේ දිය.

1–767—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

### කැකිරාව සුළු නගර සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාර තැන වූ කැකිරාව සුළු නගර සභාවේ පාලන නිලධාරි, ඩබ්ලිව්. කලුපහන වන මම 1975 වර්ෂයේ දී පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් දිනවල දී කැකිරාව සුළු නගර සභා සීමාව තුළ දී මස් පිණිස සතුන් මැරීම සහ මස් විකිණීම සම්පූර්ණයෙන් ම තහනම් කරමි.

#### උපලේඛනය

1975 ජනවාරි 27, පසළොස්වක පෝය දිනය,
1975 පෙබරවාරි 25, පසළොස්වක පෝය දිනය,
1975 මාර්තු 26, පසළොස්වක පෝය දිනය,
1975 අප්‍රේල් 25, පසළොස්වක පෝය දිනය,
1975 මැයි 22, ජනරජ දිනය,
1975 මැයි 24, 25 පසළොස්වක පෝය දිනය හා පසළොස්වක පෝය දිනට පසු දිනය,
1975 ජූනි 23, පසළොස්වක පෝය දිනය,
1975 ජූලි 22, පසළොස්වක පෝය දිනය,
1975 අගෝස්තු 21, පසළොස්වක පෝය දිනය,
1975 සැප්තැම්බර් 17, ශ්‍රීමත් අනගාරික ධර්මපාල දිනය,
1975 සැප්තැම්බර් 19, පසළොස්වක පෝය දිනය,
1975 සැප්තැම්බර් 26, බණ්ඩාරනායක දිනය,
1975 ඔක්තෝබර් 04, සමස්ත ලෝක සත්ව දිනය,
1975 ඔක්තෝබර් 19, පසළොස්වක පෝය දිනය,
1975 නොවැම්බර් 18, පසළොස්වක පෝය දිනය,
1975 දෙසැම්බර් 18, පසළොස්වක පෝය දිනය.

ඩබ්ලිව්. කලුපහන,
පාලන නිලධාරි,
කැකිරාව සුළු නගර සභාව.

1975 ජනවාරි මස 06 දින,
කැකිරාව සුළු නගර සභා කාර්යාලයේ දීය.

1–779—75.01.31 දින අංක 149 දරණ ගැසට් පත්‍රය

---

### කලුතර දිස්ත්‍රික්කය—කලුතර නගර සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 17(1) ඡේදයේ ප්‍රකාර නිසි බලධරයා වූ කලුතර දිස්ත්‍රික්කයේ කලුතර නගර සභාවේ පරිපාලන නිලධාරි වන පොන්නායමන් වින්සන්ට් වන මා වෙත පැවරී තිබෙන බලතල පරිදි, 1975 වර්ෂය තුළදී කලුතර නගර සභා සීමාව තුළ මෙහි පහත උපලේඛනයේ සඳහන් දිනවලදී මස් පිණිස සතුන් මැරීම හා මස් විකිණීම මෙයින් තහනම් කරමි.

#### උපලේඛනය

1975 ජනවාරි 27—දුරුතු පුර පසළොස්වක් පෝය දිනය
1975 පෙබරවාරි 25—නවම් පුර පසළොස්වක් පෝය දිනය
1975 මාර්තු 26—මැදින් පුර පසළොස්වක් පෝය දිනය
1975 මාර්තු 28—මහ සිකුරාදා
1975 අප්‍රියෙල් 25—බක් පුර පසළොස්වක් පෝය දිනය
1975 මැයි 22—ජනරජ දිනය
1975 මැයි 24—වෙසක් පුර පසළොස්වක් පෝය දිනය
1975 මැයි 25—වෙසක් පුර පසළොස්වක් පෝය දිනට පසු දිනය
1975 ජූනි 23—පොසොන් පුර පසළොස්වක් පෝය දිනය
1975 ජූලි 22—ඇසළ පුර පසළොස්වක් පෝය දිනය
1975 අගෝස්තු 21—නිකිණි පුර පසළොස්වක් පෝය දිනය
1975 සැප්තැම්බර් 19—බිනර පුර පසළොස්වක් පෝය දිනය
1975 සැප්තැම්බර් 26—බණ්ඩාරනායක සමරු දිනය
1975 ඔක්තෝබර් 4—ලෝක සත්ව දිනය
1975 ඔක්තෝබර් 19—වප් පුර පසළොස්වක් පෝය දිනය
1975 නොවැම්බර් 18—ඉල් පුර පසළොස්වක් පෝය දිනය
1975 දෙසැම්බර් 18—උඳුවප් පුර පසළොස්වක් පෝය දිනය.

පී. වින්සන්ට්,
පරිපාලන නිලධාරි,
කලුතර නගර සභාව.

1975 ජනවාරි මස 06 දින,
කලුතර නගර සභා කාර්යාලයේ දීය.

1–575—75.01.31. දින අංක 149 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රය පළ කිරීම සඳහා නිවේදන භාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන් අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වෙනවාත් හැර සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1975**

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | ... 03.01.75 | සිකුරාද | ... 27.12.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 10.01.75 | සිකුරාද | ... 03.01.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 17.01.75 | සිකුරාද | ... 10.01.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 24.01.75 | සිකුරාද | ... 17.01.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 31.01.75 | සිකුරාද | ... 24.01.75 | සිකුරාද | දවල් | 12.00 |
| පෙබරවාරි | ... 07.02.75 | සිකුරාද | ... 31.01.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 14.02.75 | සිකුරාද | ... 07.02.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 21.02.75 | සිකුරාද | ... 14.02.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 28.02.75 | සිකුරාද | ... 21.02.75 | සිකුරාද | දවල් | 12.00 |
| මාර්තු | ... 07.03.75 | සිකුරාද | ... 28.02.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 14.03.75 | සිකුරාද | ... 07.03.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 21.03.75 | සිකුරාද | ... 14.03.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 27.03.75 | බ්‍රහස්පතින්ද | ... 21.03.75 | සිකුරාද | දවල් | 12.00 |
| අප්‍රේල් | ... 04.04.75 | සිකුරාද | ... 27.03.75 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 11.04.75 | සිකුරාද | ... 04.04.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 18.04.75 | සිකුරාද | ... 11.04.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 24.04.75 | බ්‍රහස්පතින්ද | ... 18.04.75 | සිකුරාද | දවල් | 12.00 |
| මැයි | ... 02.05.75 | සිකුරාද | ... 24.04.75 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 09.05.75 | සිකුරාද | ... 02.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 16.05.75 | සිකුරාද | ... 09.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 23.05.75 | සිකුරාද | ... 16.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 30.05.75 | සිකුරාද | ... 23.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| ජූනි | ... 06.06.75 | සිකුරාද | ... 30.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 13.06.75 | සිකුරාද | ... 06.06.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 20.06.75 | සිකුරාද | ... 13.06.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 27.06.75 | සිකුරාද | ... 20.06.75 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී